**ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**
**இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு**
**HUMAN RIGHTS COMMISSION OF SRI LANKA**

මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date 2016.09. 28

පැමිණිලිකරු : පී.සී.ජී. පෙරේරා මයා,
නො : 21/7/ඒ, ඉන්ද්‍රා මාවත,
කළුබෝවිල.

වගඋත්තරකරු : විදුහල්පති,
අනුලා විද්‍යාලය.
නුගේගොඩ.

**පැමිණිලි අංකය : HRC/4236/15**

පැමිණිල්ල -

ඉහත පැමිණිලිකරු විසින් මානව හිමිකම් කොමිෂන් සභාව හමුවේ පැමිණිල්ලක් ගොනු කරමින් සඳහන් කර ඇත්තේ, 2016 වර්ෂය සඳහා වගඋත්තරකාර විද්‍යාලයෙහි පළමු ශ්‍රේණියට තම දියණිය ඇතුළත් කිරීමේදී අසාධාරණයක් සිදුවූ බවයි. වගඋත්තරකාර විද්‍යාලයෙහි පළමු ශ්‍රේණියට තම දියණිය ඇතුළත් කර ගැනීමට මෙම පැමිණිල්ල මඟින් අපේක්ෂා කරන බවද සඳහන් කර ඇත.

වගඋත්තරකරුගේ ස්ථාවරය -

උක්ත පැමිණිල්ල සම්බන්ධයෙන් පැමිණිලිකාර සහ වගඋත්තරකාර යන දෙපාර්ශවයෙහි සහභාගීත්වයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවේදී පවත්වන ලද පරීක්ෂණයේදී සිය ස්ථාවරය ගෙනහැර දක්වමින් වගඋත්තර පාර්ශවය සඳහන් කර ඇත්තේ, සම්මුඛ පරීක්ෂණයේදී ලකුණු 82 ක් ලබා ඇති නමුත් ස්ථානීය පරීක්ෂණයේදී පදිංචිය සනාථ නොවීම මත දරුවාගේ අවස්ථාව අහිමිවී ඇති බවයි. පාසලට ළමුන් ඇතුළත් කර ගැනීමේ කඩඉම් ලකුණු මට්ටම 80 ක් වන බවද සඳහන් කර ඇත.

තවද මේ සම්බන්ධයෙන් අදාළ කමිටුව හා සාකච්ඡා කොට ඉදිරියේදී සිය ස්ථාවරය ලිඛිතව මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දැනුම් දෙන බවට වගඋත්තර පාර්ශවය විසින් පරීක්ෂණ අවස්ථාවේදී සඳහන් කර ඇත.



ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 165, කිංසි පාර, කොළඹ - 08. / 165, கின்சி வீதி, கொழும்பு - 08. / 165, Kynsey Road, Colombo - 08.
සභාපති / தவிசாளர் / Chairman: 011-2696470
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2696470
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrc@sltnet.lk
දුරකථන / தொலைபேசி / Telephone: 94 - 11 - 2694925, 2685980, 2685981
ලේකම් / செயலாளர் / Secretary: 011-2689558
ක්ෂණික / துரித அழைப்பு / Hotline: 011-2689558, 1996
වෙබ් / இணையம் / Web: www.hrcsl.lk

ඒ අනුව අදාළ වාර්තාව 2016.02.17 වන දින කොමිෂන් සභාව වෙත ලබාදී ඇති අතර මානව හිමිකම් කොමිෂන් සභාවේ උපදෙස් මත 2016.01.22 වන දින ප.ව 9.50 ට ස්ථානීය පරීක්ෂණයක් සිදු කිරීමට වගඋත්තරකරුවන් විසින් කටයුතු කර ඇත. එහිදී අයදුම්කරු නිවසේ නොසිටි බවත්, අයදුම්කරුගේ මව පියා සහ දරුවෙකු සිට ඇති බවත්, දරුවා නිදා සිටි බැවින් තොරතුරු අනාවරණය කර ගැනීමට නොහැකි වූ බවත් වගඋත්තරකරුවන් විසින් සඳහන් කර ඇත. කෙසේ වුවද පදිංචිය ගැටළු සහගත වූ බැවින් නැවත 2016.02.09 වන දින ප.ව 8.10 ට අදාළ ස්ථානය පරීක්ෂාව සිදු කොට ඇති බවත් එහිදී අයදුම්කරුගේ බිරිඳ හා දරුවන් සිටි බවට වගඋත්තරකරුවන් විසින් කොමිෂන් සභාව වෙත දන්වා ඇත.

**නිරීක්ෂණ :-**

පැමිණිලිකරු ආසන්නතාව ගණය යටතේ සම්මුඛ පරීක්ෂණය සඳහා CO/156 අංකය යටතේ පෙනී සිටින ලදුව, ලකුණු 82 ක් ලබා ඇති බව නිරීක්ෂණය වේ.

| | | |
|---|---|---|
| ඡන්ද හිමිකම | : | ලකුණු 35 |
| හිමිකම් ලේඛන (ඔප්පුව) | : | ලකුණු 06 |
| අතිරේක ලේඛන | : | ලකුණු 01 |
| ආසන්නතාවය | : | ලකුණු 40 |
| එකතුව | : | ලකුණු 82 |

කඩඉම් ලකුණු මට්ටම ලකුණු 80 ක් වුවද ස්ථානීය පරීක්ෂණයේදී පදිංචිය සනාථ නොවීම මත අවසන් ලේඛනයට පැමිණිලිකරුගේ දරුවාගේ නම ඇතුළත්ව නොමැත. පැමිණිලිකරු ප්‍රකාශ කර ඇත්තේ, තමන් රැකියාව සඳහා දිවාකල පිටත්ව යන බැවින් පාසැලෙන් පැමිණි අවස්ථාවේ නිවසේ නොසිටි බවයි. නැවත වරක් මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවති පරීක්ෂණයෙන් අනතුරුව දෙවරක් ස්ථානීය පරීක්ෂාව සිදුකර ඇති අතර, දෙවන අවස්ථාවේදී පැමිණිලිකරුගේ දරුවන් හා බිරිඳ නිවසේ සිට ඇති බව නිරීක්ෂණය වේ. ඒ තුළින් පැමිණිලිකරුගේ පදිංචිය තහවුරු වන බව කොමිෂන් සභාව නිරීක්ෂණය කරයි. එසේම පාසැලට ඇතුළත්වීම සඳහා අවැසි කඩඉම් ලකුණු මට්ටම වන ලකුණු 80 සීමාවද ඉක්මවා පැමිණිලිකරු විසින් ලකුණු ලබාගෙන ඇති බවද නිරීක්ෂණය වේ.

තවද පැමිණිලිකරුගේ වැඩිමහල් දියණිය වන ටෙහාරා ඉන්සරි පෙරේරා ශිෂ්‍යාව 2014 වර්ෂයේදී ඉහත ලිපිනයෙන්ම අයදුම් කරන ලදුව සම්මුඛ පරීක්ෂණයට පෙනී සිට ලකුණු ලබා ඇතුළත්වීමේ අංක : 30986 යටතේ වගඋත්තරකාර විද්‍යාලයට ඇතුළත් කර මේ වන විට 2 වන ශ්‍රේණියේ අධ්‍යාපනය ලබමින් සිටින බවද එමඟින්ද තවදුරටත් පැමිණිලිකරුගේ පදිංචිය තහවුරු වන බවද නිරීක්ෂණය වේ.

පැමිණිලිකරු එම ස්ථානයේ පදිංචි නොවන බවට නිගමනයකට එළඹීමට සාධාරණ හේතු නොමැති බවත්, එවැනි නිගමනයකට පාසල එළඹී ඇත්තේ අත්තනෝමතික ලෙස බවත් කොමිෂන් සභාවේ මතය වේ.

ඒ අනුව අදාළ දරුවා වගඋත්තරකාර විද්‍යාලයට ඇතුළත්වීමට අවැසි සුදුසුකම් පූරණය කර ඇති බව මනාව ගම්‍ය වේ.

නිගමනය -

උක්ත සියළු කරුණු කරුණු අනුව, 1978 ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III වන පරිච්ඡේදය යටතේ සුරක්ෂිත කරන ලද්දාවූ 12(1) ව්‍යවස්ථාව ප්‍රකාරව සමානාත්මතාවයේ අයිතිවාසිකම වගඋත්තරකරුගේ ක්‍රියා කලාපය තුළින් උල්ලංඝනය වී ඇති බවට නිගමනය කරනු ලැබේ.

නිර්දේශය -

ඒ අනුව වගඋත්තරකාර නුගේගොඩ අනුලා විද්‍යාලයේ පළමු ශ්‍රේණියේ සමාන්තර පන්තියකට පොල්වත්තගේ ප්‍රියානා උත්සරී පෙරේරා දියණිය ඇතුළත් කිරීමට කටයුතු කළ යුතු බවට වගඋත්තර පාර්ශවය වෙත මෙයින් දන්වා සිටිමි.

2016.10.12 දිනට පෙර මෙකී නිර්දේශය ක්‍රියාත්මක කර ඒ සම්බන්ධ වාර්තාවක් කොමිෂන් සභාවට ලැබීමට සලස්වන ලෙස 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 15 වන වගන්තිය ප්‍රකාරව වගඋත්තරකරුවන් වෙත දන්වමු.

එසේම එකී නිර්දේශය ක්‍රියාත්මක වීම හෝ නොවීම සම්බන්ධව පැමිණිලිකරු විසින්ද ඉහත දින සිට සතියක කාලයක් තුළ කොමිෂන් සභාවට දැනුම් දිය යුතු වන අතර, එදිනට පෙර අදාළ දැනුම්දීම සිදු නොකරන්නේ නම් පසුව ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් සලකා නොබලන බවද වැඩිදුරටත් දන්වමු.

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
**Human Rights Commission of Sri Lanka**
**No. 165, Kynsey Road,**
**Colombo 08.**

කොමසාරිස්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

**Commissioner**
**Human Rights Commission of Sri Lanka**
**No. 165, Kynsey Road,**
**Colombo 08.**

පිටපත - ලේකම්,
අධ්‍යාපන අමාත්‍යංශය,
ඉසුරුපාය, බත්තරමුල්ල.

B/..